**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2020**

----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හාසිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය රු.13,339,684,395 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | **එකඟවෙමු.** කෙටුම්පත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කමිටුව විසින් සමාලෝචනය කර ජාතික විගණන කාර්යාලයේ එකඟතාවය සඳහා යොමුකොට ඇති අතර එකඟතාවය ලද වහාම එපරිදි කටයුතු කරමි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා රු.12,978,983 ක ස්ථාවර වත්කම් ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51ඡේදය ප්‍රකාරව නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එකඟවෙමු. කෙටුම්පත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය ජාතික විගණන කාර්යාලයේ එකගතාවය සඳහා යොමු කොට ඇත.එම එකඟතාවය ලද වහාම එපරිදි කටයුතු කරන බව දැනුම් දෙමි. | වත්කම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුකළ අගය මත බදු වගකීම රු.43,145,810 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකතුකළ අගය මත බදු අගයන් නියමාකාරයෙන් 2020 වසර තුල ගිණුම් ගත කර ඇති අතර තවදුරටත් පසුගිය වර්ෂයන්වල එකතුකල අගයමත බදු ගිණුම විශ්ලේශණය කර ආරම්භක ශේෂයේ වෙනස නිරීක්ෂණය කිරීමට කටයුතු කරන බව කරුණාවෙන් දන්වා සිටිමු. | මූල්‍ය ප්‍රකාශනවල එකතුකළ අගය මත බදු වටිනාකම නිවැරදිව දැක්විය යුතුය. |
| (ආ) ගිවිසුම්වලට එළඹීමෙන් තොරව මඩුකන්ද සංනිවේදන කුලුන භාවිතාකරන කරන ක්‍රියාකරුවන් 05 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබුණු රු.22,097,446 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ඔවුන්ගෙන් ලැබිය යුතු රු.2,678,603 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ නොවෙමු.මඩුකන්ද කුළුණු ක්‍රියාකරුවන් 05 දෙනෙකු විසින් ගිවිසුම් අත්සන් කොට නොමැති වුවද ගෙවීමට එකඟතාවය පළකොට එම මුදල් පියවා ඇති අතර 2011 සිට 2019 වර්ෂය දක්වා සියලුම අයවිය යුතු මුදල් සමාලෝචිත වර්ෂයේදී ගණනය කොට යවා ඇති අතර ඒවා දැනුම් දීමේ නිවේදන ආකාරයෙන් ක්‍රියාකරුවන් වෙත යොමු කොට මුදල් ගෙවීමෙන් අනතුරුව බදු ඉන්වොයිසි නිකුත් කොට ඒවා ලැබුණු මාසයේදී මුදල් පදනම මත වාර්තාකොට අදාල බදු මුදල්ද නිසි පරිදි ප්‍රේෂණය කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන තුළ අගයන් නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) පෞද්ගලික සමාගමක් විසින් 2012 පෙබරවාරි සිට 2020 දෙසැම්බර් දක්වා මඩුකන්ද සංනිවේදන කුලුනෙන් ලබාගත් පහසුකම් සඳහා 2021 වර්ෂයේ ලැබී තිබුණු රු.7,089,343ක් | මොබිටෙල් ආයතනය විසින් 2012 පෙබරවාරි 14 සිට 2020.12.31 දක්වා වූ මුදල 2021 අප්‍රේල් 21 දින ගෙවා ඇත. | ලැබිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඈ) හිමිකම් ඔප්පුවක් සහිත හම්බන්තොට විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. තවද රු.45,000,000 ක් වටිනා අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ක ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 69 ක් ප්‍රාදේශීය සභාවක් අත්පත් කරගෙන තිබුණද ඊට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | එකඟ නොවෙමු. මුදලක් ගෙවීමෙන් තොරව 2017 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.44,000,000 වූ මෙහි තක්සේරු වටිනාකම පමණක් පවතින හෙයින් ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව අනෙකුත් ඉඩම් සමඟ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකවෙන් දැනුම් දෙමු.<br>කදිරාන ඉඩමේ සත්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් යොදා ඇති අතර කොමිෂන් සභාවට අයත් කොටස ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කිරීමේ අවශ්‍යතාවය පවතින ඇතිහෙයිනි. | සියළු වත්කම් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ආයතන 04 කින් අයවිය යුතු රු.161,033,612 ක ණය ශේෂ පැවතියද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එක් ආයතනයක පමණක් ණයහිමි ශේෂය රු.4,435,922 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර අනෙක් ආයතන වල ණයහිමි ශේෂ නොපැවතුණු බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවෙන් අයවියයුතු මුදල රු.145,283,350ක් අයකර ගැනීම සඳහා ලිපි යවා ඇත. අනෙකුත් රාජ්‍ය ආයතන 3 න් නොපියවන ලද මෙම මුදල පිළිබඳව වරින්වර සිහිකැඳවීමේ ලිපි ද යොමු කළද පිළිතුරක් හෝ එවැනි ශේෂයක් පොත්වලින් හෙළිදරව් නොවන බවක්ද දන්වා නොමැත. | ණයගැති ශේෂ පවතින බව හා ඒවායේ අගයන් නිවැරදි බව තහවුරු කරගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ඉඩම් | 103,863,771 | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හෝ වෙනත් අනුශාංගික ලිඛිත සාක්ෂි | එකඟවෙමු. ඊලඟ වසරේ විගණනයේදී එය සකස් කොට සැපයීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට එකඟ වෙමු. | වත්කම්වල පැවැත්ම හා වටිනාකම් ලිඛිත සාක්ෂි මගින් තහවුරු කරගත හැකි පරිදි ලේඛන හා තොරතුරු පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ණයගැතියන් | 4,125,687 | ශේෂ තහවුරු කිරීමේ ලිපි | එකඟ නොවෙමු. තෝරා එවන ලද සාම්පලයට අදාල සියලු ණයගැතියන් වෙත ණයගැති ශේෂය තහවුරු කොට ඔබ වෙත සෘජුවම පිළිතුරු එවන ලෙස ඉල්ලා ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමු කර ඇත. | ණයගැති ශේෂ තහවුරු කරගෙන වටිනාකම් මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් ආරම්භක ශේෂයෙහි ඇතුළත් සමාගමකින් අයවිය යුතු රු.6,359,303 ක් 2021ජූලි 13 දින වනවිටත් අය කර ගෙන නොතිබුණි. | Lanka Cable Satellite Network Ltd. LCSN ආයතනය නොගෙවූ විදුලි සංදේශ බදු අයකර ගැනීමට නීති අංශය මගින් කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.373,509,522 ක් වූ අතර වැඩියෙන් අයකර ගන්නා ලද රු.2,177,058 ක් ණයගැති ශේෂයට ඇතුළත් වී තිබුණද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩියෙන් අයකර ගන්නා ලද ශේෂය සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ ගනුදෙනුවල ප්‍රතිඵලයක් නොවන බව දැනුම් දෙමි. | ණයගැති ශේෂ නිරවුල් කර ගත යුතුය. |
| (ඇ) නිලධාරිණියක් වෙත වැඩ තහනම් කරන ලද කාලය තුළදී දීමනා ලෙස 2013 වර්ෂයේදී ගෙවන ලද රු.424,000 ක මුදල 2019 අගෝස්තු 29 දිනැති විනය නියෝගයෙහි සඳහන් පරිදි ආපසු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී අපොහොසත් වී තිබුණි. | විනය නියෝගය අනුව වැඩිපුර ගෙවන ලද මුදල නැවත ගෙවන ලෙස දන්වා ඇති නමුත් ගෙවීම පැහැර හරින ලදී. පාරිතෝෂිතය ගණනය කිරීමේදී අඩුකර ගැනීමට ද පනත අනුව සේවායාහට නීතිමය හැකියාවක් නොමැති බව කම්කරු කොමසාරිස් ජනරාල් දන්වන ලදී. | දීමනා ගෙවීම් නිවැරදිව සිදුකළ යුතු අතර නීත්‍යානුකූල ලෙස හිමිකමක් නොමැති ගෙවීම් ආපසු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජුනි 02 PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | 2020 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාව විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 1,500 ක මුදල සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | එකඟ නොවෙමු.<br>1996 අංක 27 (සංශෝධිත) දරන ශ්‍රී. ල. වී.ස. නි. කො. සභාපනතේ 22 (ඊ) වගන්තිය ප්‍රකාරව අරමුදලක් තබාගත හැකිබව සඳහන්වන අතර 1971 අංක 38 දරන මුදල් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව කිසිවිටක ශ්‍රී.ල.වී.ස.නි.කො. සභාව සතුව අතිරික්ත අරමුදලක් නොපවතී. පනත්වලට අනුකූල කාර්යයන් සඳහා පමණක් ඉතාම කෙටි කාලීනව තාවකාලිකව අරමුදලක් වෙන්කර තබාගනු ලබන අතර එම අරමුදල් ජංගම ගිණුම්හි පවත්වාගෙන නොගොස්, ඵලදායි ලෙස කෙටි කාලීනව කළමනාකරණය කරනු ලබන අතර කිසිදු විටෙක ආයෝජන අරමුණකින් සිදු නොකරන බව ද දැනුම් දීමට කැමැත්තෙමු.<br>එමෙන්ම, 2011/06/09 දින, මෙම තාවකාලික අරමුදල් නිසි ලෙස මූල්‍ය කළමනාකරණය කිරීම ට අවසර ඉල්ලා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක්ද යොමුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව තාවකාලික අතිරේක අරමුදල් ආයෝජනය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>(i) 9.3 වගන්තිය | මාස 03 නොඉක්මවන කාලසීමාවකට වැඩබලන තනතුරකට පත්කිරීම් සිදු කළ යුතු වුවද ඊට පටහැණිව වැඩ බැලීමේ පත්කිරීම් 08 ක් සිදු කර තිබුණි. | දැනට සිදු කරනු ලබන බඳවා ගැනීමේ පටිපාටියේ සංශෝධන අවසන් වූ විට මෙම තනතුරු සඳහා ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරමින් පවතී. | වැඩ බැලීමේ තනතුරු සඳහා පත්කිරීම් කටයුතු චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 9.12 වගන්තිය | කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වෛද්‍ය රක්ෂණාවරණය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.<br>සමාලෝචිත වර්ෂය සඳහා රක්ෂණ වාරික ලෙස රක්ෂණ සමාගමකට රු.55,256,869 ක් ගෙවා තිබුණු අතර කොමිෂන් සභා නිලධාරීන් 235 දෙනෙකු වෙත රු.26,176,701 ක් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ගෙවිය යුතු වැටුප් හා දීමනා පිළිබඳව තීරණය කිරීමට 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතෙහි 22 (ඇ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත බලතල පැවරී ඇති බව නීතිපති විසින් දැනුම් දී ඇත.<br><br>2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛය නිකුත්කරන විටත් ජීවිත හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන බැවින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) 9.14.2වගන්තිය | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් හා භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබූ අතර කොමිෂන් සභාව විසින් පමණක් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියකට අනුව කටයුතු කර තිබුණි. | අනුමත කාර්යමණ්ඩලය හා ආයතනයේ සංවිධානව්‍යුහය තක්සේරු කර ප්‍රතිසංවිධානය කිරීම විගණන කමිටුවේ උපදෙස් මත විශේෂ කමිටුවක් පත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තෝරා ගනු ලැබුණු අතර එහි උපදේශක මණ්ඩලයක් විසින් මෙම කටයුතු මෙහෙයවනු ලබයි.<br>සංකීර්ණ වූ එම කාර්යය නිම කිරීමෙන් පසු රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) 2007 ජූනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා අනුමත මාසික ප්‍රවාහන දීමනාවක් වූ රු.2,000 ඉක්මවා රු.6,000බැගින් ගෙවීම නිසා | 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 22 ඇ (1) ආ වගන්තියේ බලය ලබාදී ඇති පරිදි අංක 2KX.189.15(17) හා 2010 මාර්තු මස 11 දින කොමිෂන් සභා තීරණය පරිදි | ප්‍රවාහන දීමනාව ගෙවීම අනුමැතියට අනුව කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේදී රු.8,764,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන දීමනාව රු.6000/- ගෙවීම අනුමත කර ඇත. | |
| (ඇ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොගෙන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා, ගෙවල් කුලී දීමනා හා භාවිතයට නොගත් නිවාඩු සඳහා දීමනා ලෙස රු.77,621,496 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | පනතෙහි 22 (ඇ) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව කොමිෂන් සභාවේ අනුමැතිය මත ගෙවා ඇති අතර කොමිෂන් සභාවට වැටුප් හා දීමනා තීරණය කිරීමට බලතල එම පනත මගින් පැවරී ඇති බව දැනුම් දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.28,028,050,762 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.37,883,540,711 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,855,489,949 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බලපත්‍ර ගාස්තු ආදායම, විදුලි සංදේශ බදු ආදායම හා විදුලි සංදේශ සංවර්ධන ගාස්තු රු.9,422,955,136 කින් අඩුවීම හා පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ආදායම අය නොකිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොමිෂන් සභාවේ ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2020.12.31 දිනට | 2019.12.31 දිනට | වෙනස අඩුවීම / (වැඩිවීම) | වෙනසේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| බලපත්‍ර ගාස්තු ආදායම | 12,036,758,914 | 16,175,312,122 | (4,138,553,208) | (26) |
| විදුලි සංදේශ බදු ආදායම | 10,826,164,612 | 15,065,669,041 | (4,239,504,429) | (28) |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 4,292,953,440 | 5,337,850,939 | (1,044,897,499) | (20) |
| පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ආදායම | - | 192,765,504 | (192,765,504) | (100) |

| | | | | |
|---|---|---|---|---|
| මුළු ආදායම | 29,000,860,956 | 38,575,208,162 | (9,574,347,206) | (25) |
| මුළු වියදම | 972,810,192 | 691,667,451 | 281,142,741 | 41 |
| වර්ෂයේ බදු පෙර ලාභය | 28,028,050,762 | 37,883,540,711 | (9,855,489,949) | (26) |

(අ) 2018 නොවැම්බර් 05 දින හා 2019 දෙසැම්බර් 01 දින සිදුකරන ලද සංශෝධනයන්ට අනුව විදුලි සංදේශ බදු සියයට 25 සිට සියයට 11.25 දක්වා අඩුවීම හේතුවෙන් විදුලි සංදේශ බදු ආදායම රු.15,065,669,041 සිට රු.10,826,164,612 දක්වා රු.4,239,504,429 කින් අඩුවීම, 2019 ජූනි 11 සිට ක්‍රියාත්මක වන පරිදි පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ඉවත් කර තිබීම හා ස්මාර්ට් ෆෝන් භාවිතය, ඕවර් ද ටොප් (Over the top) නොමිලේ භාවිතා කළ හැකි මොබයිල් ඇප්ලිකේෂන් භාවිතය ඉහල යාමද ආදායම අඩුවීමට බලපා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ මුළු වියදම වූ රු.739,137,932 න් පරිපාලන හා මෙහෙයුම් වියදම් සඳහා රු.679,034,945 ක් හෙවත් සියයට 92 ක් වැය කර තිබුණ අතර එයින් කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා රු.431,252,335 ක් හෙවත් සියයට 64 ක් ඒ තුළ ඇතුළත් වී තිබුණි. එසේ වුවද ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන විදුලි සංදේශ නියාමනය සඳහා මුළු වියදමෙන් රු.54,779,057 ක් හෙවත් සියයට 7 ක් පමණක් වැය කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි පර්චස් 6.21ක ඉඩමෙහි අයිතිය පවරා ගැනීම සඳහා 1999 හා 2010 වර්ෂවලදී එහි තක්සේරු වටිනාකම හා වෙනත් වියදම් සඳහා රු.345,502 ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එහි අයිතිය සමාලෝචිත වර්ෂයේදී ද ලබාගෙන නොතිබුණි. තවද ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්යය මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල හිමිකම් ඔප්පු හෝ බදු ගිවිසුම් හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලබාගෙන නොතිබුණි. | හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය, අදාල ගෙවීම් සියල්ල සිදුකර අවසන් වී ඇති අතර සින්නක්කර ඔප්පුව ලබාදීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගතයුතු බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දන්වා ඇත.<br>කොකාවිල් බහුකාර්ය මධ්‍යස්ථානය :ඉඩම පවරාදීම සඳහා කටයුතු කරන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීමක් කර සිහිකැඳවීමක් යවා ඇත. | වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොකාවිල් සන්නිවේදන කුළුන භාවිතා කරන රාජ්‍ය ආයතන 03 කින් 2012 වර්ෂයේ සිට අයවියයුතු රු.91,929,931 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | එකඟතා ගිවිසුම්ගතවීම පිළිබඳව නීති අංශය විසින් දැනුම් දී ඇති අතර මෙම ආයතනයෙහි හිඟ ගෙවීම් පිළිබඳව ඒකී ආයතන හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙතද ලිපි මගින් දැනුවත් කළද මේ දක්වා ලිඛිත ප්‍රතිචාර ලැබී නොමැත. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වේ. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජූලි 28 දින එළඹුණු ගිවිසුම කොමිෂන් සභාව විසින් 2016 අගෝස්තු 10 වන දින අවසන් කර තිබූ අතර එම තීරණයට එරෙහිව හා ඇස්තමේන්තුගත වන්දිය රු.706,666,172 ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත්කර තිබුණි. කොන්ත්‍රාත්තුව නිම කරන දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 33.1ක්වූ අතර ඒ සඳහා දරන ලද රු.මිලියන 684 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කොමිෂන් සභා තීරණයට අනුව ඉදිකිරීම් නතර කල අතර ඉදිරි කටයුතු ආරම්භ කිරීම සඳහා පවතින නීති ගැටළු විසඳා ගැනීමට නීති අංශය කටයුතු කරගෙන යනු ලබයි. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම නිසා ඇති වූ නිශ්කාර්ය වියදම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ ප්‍රාරම්භක කටයුතුවල උපදේශන ගාස්තුව ලෙස රු.10,057,910 ක් 2015 ජනවාරි 25 දින මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණද මෙතෙක් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදු කර නොතිබුණි. තවද ප්‍රධාන | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකරිත්ය විසින් ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා උපදේශක ආයතනය වන මොරටුව විශ්වවිද්‍යාලය වෙත මුදල් ගෙවා ඇති අතර එහි ප්‍රරම්භක වැඩ කටයුතු මොරටුව විශ්වවිද්‍යාලය මගින් සිදුකර ඇත. ඉන් අනතුරුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන | ඉදිකිරීම් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ඒ අනුව කටයුතු කර ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවට ප්‍රධාන ගොඩනැගිල්ලට දිගුවක් ලෙස කොන්ත්‍රාත්තුවක් සිදු කරමින් පවතින බැවින් කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා ඇති උක්ත උපදේශන ගාස්තුව නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය විසින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කළ අතර ඉන් අනතුරුව ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමට ද බලාපොරොත්තු වේ. | |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු.1,266,700,000 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 06 ක් අවශ්‍යතාවයක් නොමැතිවීම හා අධ්‍යක්ෂ ජනරාල් අත්හිටුවීම නිසා සමාලෝචිත වර්ෂයේ සිදුකර නොතිබුණු අතර අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා නොගෙන සැලසුම් සකස් කිරීම නිසා ප්‍රතිපාදන වෙනත් අත්‍යවශ්‍ය කටයුතු සඳහා යෙදවීමට තිබූ අවස්ථාව අහිමිවී තිබුණි. එසේම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.1,140,550 ක් වටිනා ප්‍රසම්පාදන 06 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර රු.1,083,495,000 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 34 ක් ක්‍රියාත්මක නොවීමට හේතු හෝ ක්‍රියාත්මක කළ බව හෝ දක්වා නොතිබුණි. | වර්තමාන අවශ්‍යතාවයක් නොමැති බව පාලන අංශයට දන්වා ඇති බැවින් එම ප්‍රසම්පාදනයන් අත් හැර දැමීමට කටයුතු කරන ලදී.<br>අයවැය පාලන අංශයට ලැබීම ප්‍රමාද වීම කොරෝනා වයිරසය රේඛීය අමාත්‍යාංශයේ වෙනස්වීම්, ප්‍රසම්පාදන කමිටුවවල තිබූ පුරප්පාඩු වැනි හේතූන් නිසා ව්‍යාපෘති සමාලෝචිත කාලය තුල ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) කොමිෂන් සභාවේ සේවක සංයුතිය, සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනීමේ ක්‍රමවේදය ප්‍රතිසංශෝධනය කර ගැනීම සඳහා උපදේශක සේවාවන් ලබාගැනීමට 2020 ඔක්තෝබර් 20 දින කොමිෂන් සභාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ එළඹි රු.2,992,330 ක් වටිනා ගිවිසුමෙහි කාලය 2021 | කොවිඩ් 19 හේතුවෙන් ක්‍රියාවලියේ ආරම්භක කටයුතු බාධා වූ අතර මෙම කාර්යය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වේ. මේ වන විට යෝජිත බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත ඉදිරිපත් කර එක් එක් අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කරමින් අවශ්‍ය සංශෝධන සිදු කරමින් ඇත. | කොමිෂන් සභාවේ සේවක සංයුතිය, සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනීමේ ක්‍රමවේදය ප්‍රතිසංශෝධනය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

ජනවාරි අවසන් වීමට නියමිතව තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු.1,490,166 ක් ගෙවා තිබුණද 2021 ජූනි වනවිටද අදාළ කාර්යය නිමකර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නෙළුම් කුලුන ව්‍යාපෘතිය<br>2010 ඔක්තොබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02ක් වෙත ප්‍රදානය කර 2012 ජනවාරි 03 දින කොමිෂන් සභාව මෙම සමාගම් සමඟ ඇ.ඩො 104,300,000 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව තිබුණද කොමිෂන් සභාව 2017ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.<br>මෙම ඉදිකිරීම් සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින කොමිෂන් සභාව, EXIM බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො.මිලියන 88.655 ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18 දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතු විය .ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අදාල කාලසටහනට අනුව නිම නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදල නියමිත පරිදි ලබාගැනීමට නොහැකිවී තිබුණ අතර අදාල කාලය තුළදී ඇ.ඩො. මිලියන 67.260 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලබාදී තිබුණි. | | |

| | | |
|---|---|---|
| මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) කොමිෂන් සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2012 ජනවාරි 23 වන දින එළඹි අවබෝධතා ගිවිසුමට අනුව නෙලුම් කුලුන ඉදිකරන ලද ඉඩම අක්කර 7රූඩ් 2 පර්චස් 8.41 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් ප්‍රමාණය අක්කර 4 රූඩ් 3 පර්චස් 24.47 ක් බව කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුවනිරීක්ෂණය විය. | එකඟවේ. නිරීක්ෂණය නිවැරදි වේ. | නිවැරදි දත්ත ඇතුලත් වන පරිදි ලේඛන පවත්වා ගත යුතුය. |
| (ii) මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතා වර්තාව අනුව 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමටත්, එමගින් පලමු වර්ෂ 5 සඳහා වර්ෂයකට රු.මිලියන 1685 ක ආදායමක්ද දෙවන වර්ෂ 5 සඳහා වර්ෂයකට රු. මිලියන 1,918 ක ආදායමක්ද ඉපැයීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘති කටයුතු ප්‍රමාදවීම මත එම වාර්ෂික ආදායම අහිමි වී තිබුණි. මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව ඉපැයීමට අපේක්ෂා කළ ආදායම මත ගණනය කළ විට 2020 දෙසැම්බර් 31 දිනට අහිමි වී තිබූ ආදායම රු.9,639,408,102 ක් වී තිබුණි. | ශක්‍යතා වාර්තාවට අනුව අදායම් ඉපයීමට නොහැකි වී ඇත. | අපේක්ෂිත ඉලක්කයන් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) මූලික සැලසුම් අනුව ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරිම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 7,877 ක් ණය වාරික හා පොලී වශයෙන් කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි. මෙසේ ණය හා වාරික ගෙවීම හේතුවෙන් විදුලි සංදේශ පනත අනුව ඒකාබද්ධ අරමුදලට කරන ලද ප්‍රේෂණ 2016 වර්ෂයට සාපේක්ෂව 2017, 2018, 2019 හා 2020 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 5,200 ක්, රු.මිලියන | TRC/CEIC/01.2011 කොන්ත්‍රත් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතු කොටගෙන දැනටමත් ප්‍රමාද ගාස්තු ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 10.43 ක් කොන්ත්‍රාත්කරුගේ අන්තර් ගෙවීම් වලින් අඩුකිරීම මගින් අයකර ගෙන ඇත. අදාළ කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය ප්‍රමාද වීමෙන් අය කර ගත හැකි උපරිම ප්‍රමාද ගාස්තුව එයවේ. තවද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කොළඹ නෙළුම් කුලුන වානිජකරණය සඳහා උපදේශක කමිටුවක් පත්කර ඇත. එම කමිටුව අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී. | ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| 6,150 ක්, රු.මිලියන 19,050 ක් හා රු. මිලියන 23,000 වශයෙන් එකතුව රු. මිලියන 53,400 ක් අඩුවී තිබුණි. | | |
| (iv) 2019 සැප්තැම්බර් 16 දින රු.11,325,012 ක වියදමක් දරා නෙළුම් කුලුන නිල වශයෙන් විවෘත කළද මේ දක්වාම කොමිෂන් සභාවට පවරා ගෙන ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | නෙළුම් කලුන කොමිෂන් සභාවට පවරාගෙන ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (v) කොමිෂන් සභා තීරණ අනුව නෙළුම් කුලුන වාණිජ්‍යකරණය කිරීමේ කටයුතු සඳහා අනුමත කාර්යමණ්ඩලයට බාහිරව කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණු නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු.13,067,971 ක දීමනා මෙතෙක් ස්ථාපනය නොකරන ලද සමාගමකින් අයකර ගැනීමේ පදනම මත ලැබිය යුතු ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොමිෂන් සභා තීරණයක් අනුව කටයුතු කර ඇත. | ස්ථාපනය නොකරන ලද සමාගමකින් වියදම් ආවරණය කිරීමේ අවදානම් සහගත බැවින් ඉන් මිදීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) අංක 10/2473/401/031 හා 2010 ඔක්තෝබර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය, පරිදි නෙළුම් කුලුන ඉදිකිරීම වෙනුවෙන් උපදේශන සේවා ලබාගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමග ගිවිසුම්ගත වීමට අනුමැතිය හිමිවී තිබුණි.ඒ අනුව 2013 පෙබරවාරි 15 දින උපදේශන සේවා ලබාගැනීම සඳහා දෙපාර්ශවය අතර අත්සන් කරන ලද ගිවිසුම් උපදේශන ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 1.5 ක් එනම් රු. මිලියන 198.7 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එම මුදලින් රු. මිලියන 150 ක් පමණක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබූ අතර අංක 2k15.219.13(ii) හා 2015 නොවැම්බර් 26 දිනැති කොමිෂන් සභා තීරණය මත උපදේශන | කොන්ත්‍රත් කාලය දීර්ඝ වීමත් සමගම ව්‍යාපෘතියේ උපදේශන සේවා ගිවිසුමද දීර්ඝ කිරීමට සිදුවූ අතර ඒ සඳහා කොමිෂන්සභා අනුමැතිය ලබාගෙන ඇත.<br>කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ගිවිසුමේ දක්වා ඇති කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම නිමකර කොන්ත්‍රාත්තුවේ උපාංග නිසි පරිදි පරීක්ෂා කර සහතිකකර ශ්‍රී ලංකා විදුලි සංදේශනියාමන කොමිෂන් සභාවට භාරදීමට අපොහොසත් වී ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා කොන්ත්‍රාත්කරු සමග ඇති කර ගෙන ඇති ගිවිසුමට අනුව මොරටුව විශ්වවිද්‍යාලය ව්‍යාපෘතියේ ඉංජිනේරු වේ. තවද කැබිනට් අනුමැතිය ලත් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් කර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට භාර දෙන තුරු | විධිමත් අනුමැතියක් හා විනිවිදභාවයකින් යුතුව උපදේශන ගාස්තු ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සේවා ගිවිසුම 2017 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව මාසිකව රු.මිලියන 03 බැගින් රු.මිලියන 72 ක් මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවීම් කර තිබුණි.එකී ගිවිසුම දීර්ඝ කළ කාලය අවසාන වීමෙන් පසු ද 2017 නොවැම්බර් 01 දින සිට 2019 සැප්තැම්බර් 16 දින දක්වාවූ කාලය සඳහා රු.මිලියන 59.8 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. 2019 සැප්තැම්බර් 16 දින නෙළුම් කුලුන විවෘත කිරීමෙන් පසු නෙළුම් කුලුන කොමිෂන් සභාව වෙත පවරා නොදීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 01 සිට2020 දෙසැම්බර් 31 දක්වාවූ කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 28.6 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. ඒ අනුව2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණු සමස්ත උපදේශන ගාස්තු වටිනාකම රු.මිලියන 310.4 ක් විය. | ව්‍යාපෘති ඉංජිනේරු කොන්ත්‍රාත්තුවේ ඇති කාර්යන් සම්පූර්ණ කරවා ගැනීම සඳහා අඛංණ්ඩව සක්‍රියව තබා ගැනීම ව්‍යාපෘති හිමිකරුගේ වගකීම වේ. ඒ අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විටින් විට ලබාදුන් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ ඉලක්කවලට අනුව ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාගේ කාර්යභාරය ඉටුකිරීමට ලබා දුන් කාලය දීර්ඝ කරන ලදී. | |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු 70 ක් වූ අතර කොමිෂන් සභාවේ ලේකම් තනතුර වර්ෂ 09 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. එසේම අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප්, නිවාස කුලී දීමනා, දිරි දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස රු.1,873,503 ක් ගෙවා තිබුණි. | දැනට පවතින බඳවා ගැනීමේ පටිපාටි සංශෝධන කරමින් පැවතීම, ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීම් නොකිරීමට රජය විසින් තීරණය කර තිබීම ඇතුළු හේතු නිසා තනතුරු සම්පූර්ණවී නැත.එසේම මේ වන විට තනතුරු සඳහා බඳවා ගැනීමට අදාල ඇබෑර්තු දැන්වීම් පල කර ඇත. | පුරප්පාඩු තනතුරු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු .මිලියන 7,736 ක් වටිනා කාර්යයන් 45ක් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණ අතර එහි ප්‍රගතිය සියයට 0.1 සිට සියයට 90.2 දක්වා විය. | කාර්යයන් 45ක් සම්පූර්ණයෙන් නිම නොකිරීමට හා එහි ප්‍රගතිය සියයට 0.1 සිට සියයට 90.2 දක්වා වීමට හා අපේක්ෂිත පරිදි ප්‍රගතිය අත්කර නොගැනීමට බාධාකාරී හා නොවැළැක්විය වසංගත තත්ත්වය හේතු වී ඇත. ඉදිරියේදී යහපත් වන පසුබිමක, ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් වල ප්‍රගතිය උපරිමව ලබා ගැනීමට අංශ ප්‍රධානීන්ගේ අවධානයට සහ අදාළ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය අංශ මට්ටමෙන් සමාලෝචනය කරමින් කටයුතු කිරීමට දැනුවත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර ආයතනයේ ප්‍රගතිය ලබාගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) අනුකූලතා අංශය විසින් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නමුත් අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම නිසා 2019 වර්ෂයේ තාවකාලිකව අත්හිටුවා තිබූ සේවා පරාමිතීන්ගේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ හා මෘදුකාංග මිලදී ගැනීමට 2020 වර්ෂයේදී රු.මිලියන 400ක් ඇස්තමේන්තු කර තිබුණද එම කාර්යය ඉටු කර නොතිබුණි. | අමාත්‍යාංශ වෙනස්වීම නිසා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම ප්‍රමාද විය. නමුත් 2020 වසරේ එම උපකරණ මිලදී ගැනීම සඳහා තාක්ෂණික පිරිවිතර සමඟ අදාළ කෙටුම්පත් ලංසු ලේඛන, කෙටුම්පත් පුවත්පත් දැන්වීම් නිර්දේශිත කමිටු සාමාජිකයින් තොරතුරු ඇතුළත් ලේඛන ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත. | ක්‍රියාත්මක කිරීමට හැකි අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා වාර්ෂික ප්‍රතිපාදන සලසා ගෙන අදාල කාර්යයන් ඉටුකර ගැනීමට පියවර ගත යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආදායම් වර්ග 08 ක් සඳහා සත්‍ය වශයෙන් එකතු කළ ආදායම රු.22,173,757,388 ක් හා අයවැයගත ආදායම රු.31,418,431,056 ක් වූයෙන් අයවැය ගත ආදායම ළඟාකර නොගැනීම රු.9,369,456,744 ක් විය. අයවැය ලේඛනයට ඇතුළත් නොවූ අයිතම් 06 කින් | ආදායම් පරිපාලනය කරනු ලබන අංශය විසින් සපයනු ලබන අතර, ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කරනු ලබන අතර පසුව ඒවා දේශපාලනික, තාක්‍ෂණික, ආර්ථිකමය, පාරිසරික සහ තරඟකාරිත්ව යනාදී බලපෑම් නිසා වෙනස් වීමට බොහෝ විට ඉඩකඩක් පවතී.<br>අයවැය පිළියෙළ කරනු ලබන අවස්ථාව | අයවැය ලේඛනය සාර්ථක පාලන කාර්යයක් ලෙස යොදාගත යුතුය. |

රු.253,477,080 ක ආදායමක් රැස්කර තිබුණු අතර අයිතම් 06 ක් සඳහා රු.5,270,841 ක් වියදම් කර තිබුණි. එසේම අයවැය ලේඛනයට ඇතුළත් රු.1,270,214,312 ක් වටිනා පරිපාලන හා නියාමන වියදම් අයිතම 38 ක් සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණු අතර අයිතම 07 ක් වෙනුවෙන් අයවැයගත වටිනාකම ඉක්මවා රු.57,649,430 ක් වැයකර තිබුණි.මේ හේතුවෙන් වාර්ෂික අයවැය ලේඛනය සාර්ථක පාලන කාර්යයක් ලෙස යොදා ගැනීමට අපොහොසත් වී තිබුණි.

වනවිට මෙම ආදායම් වර්ග 02 නොපැවති අතර "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂා කළ මුදල රටේ පැවති තත්ත්වය මත ක්‍රියාවට නැංවිය නොහැකි වූ බැවින් එම මුදල් ස්ථාවර තැන්පතුවක (රු. බිලියන 1.5 ක්) තැන්පත්කොට ස්ථාවර තැන්පතු පොළී ආදායමද වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කරන අවස්ථාව වන විට අනපේක්ෂිත ආදායමක්ව පැවතුණි. එමෙන්ම වියදම් ශීර්ෂ නාමයන් ගෙන්ම අයවැය ලේඛනයේ ඇතුළත් නොවුවද එය ඊට අදාළ සමස්ත වියදම් ශීර්ෂයන් තුළ ඇතුළත් කර ඇත. එසේම රටේ පැවති covid තත්ත්වය හමුවේ ක්‍රියාකාරී සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් නොලැබුණි.